# ශ්‍රී ලංකාවේ පැවැත්වෙන මැතිවරණ නිදහස් ද? සාධාරණ ද?

මැතිවරණ පිළිබඳ ශාස්ත්‍රීය අර්ථ දැක්වීම් රැගත් ප්‍රකාශන හැමෙකම පාහේ මැතිවරණ හැඳින්වීම් සමඟින් වරහැගෙන වදන් දෙකක් ඇත. ඉන් එකක් නිදහස් (free) වන අතර අනෙක සාධාරණ (fair) යන්නයි. මැතිවරණ හා සබැඳි වර්තමාන ප්‍රවණතා පිළිබඳ සලකා බැලීමේදී ඕනෑම මැතිවරණයක් පවත්වා අවසන ඒ පිළිබඳ නිකුත් කරන සහතිකයේ නිරායාසයෙන් අඩංගුව පවත්නා මෙම වදන් දෙක තුළ මැතිවරණ ක්‍රියාවලියේ සමස්ථාර්ථය නියෝජනය විය යුත්තේය.

මැතිවරණ පිළිබඳ ශ්‍රී ලාංකීකයන්ට ද ඇත්තේ දිගු ඉතිහාසයකි. මෙරටේ ස්ථාපිත නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කවර විසංවාද පැවතිය ද එක් කරුණක් පිළිබඳ සැමට එකඟවීමේ නොහැකියාවක් නැත. එනම් සර්වජන ඡන්ද බලය ලැබුදා පටන් මෙරටේ ආණ්ඩු බලය පිහිටුවා ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදීව පැවැත්වූ මැතිවරණ යටතේ බවයි. එකී මැතිවරණ සාපේක්ෂ වශයෙන් නිදහස් හා සාධාරණ බව සත්‍ය කරුණකි. ඒ මැතිවරණ කිහිපයක් පිළිබඳ විශ්වාසය මුළුමනින්ම බිඳවැටුණු පසුබිමකය. එනම්

- 1999 පැවති වයඹ පළාත් සභා ඡන්ද විමසීම
- 1982 පැවති ජනමත විචාරණය
- 1981 පැවති යාපනය සංවර්ධන සභා ඡන්ද විමසීම
- 1988 පැවති ජනාධිපතිවරණය
- 2006 පැවති නැගෙනහිර පළාත් ඡන්ද විමසීම

ඉහත මැතිවරණ එකල බලපැවැත්වූ තීරණාත්මක සාධක කිහිපයක් නිසාම කිසිසේත් නිදහස් වාතාවරණයක පැවැත්විය නොහැකි වූ අතර එනිසාම කිසිදු සාධාරණත්වයක් ද දක්නට නොලැබිණි. ඉන් පරිබාහිරව පවත්වා ඇති මැතිවරණ සාපේක්ෂව යහපත් වාතාවරණයක් තුළ පැවැති සාධාරණ මැතිවරණ යැයි ප්‍රකාශ කිරීමේ වරදක් නැත. තවද යම් මැතිවරණයක පවත්නා උසස් ප්‍රමිතිය අර්ථදැක්වීමෙහිලා ඉහත වදන් දෙකට පරිබාහිරව අද වන විට ව්‍යවහාරයට පැමිණ ඇති වදනක් වන්නේ "සුපිළිපන්න" බව (Intergrity) යන්නයි. යම් මැතිවරණයක් නිදහස් හා සාධාරණ වූවාට පමණක් ප්‍රමාණවත් නොවන බවත් එය සුපිළිපන්න බවින් යුක්ත එකක් විය යුතු බවත් දැන් දැන් ජාත්‍යන්තර මට්ටමින් පිළිගන්නා ප්‍රමිතියක් බවට පත්ව ඇත. එනම් යම් මැතිවරණයක් පවත්වා අවසන එය කොතරම් දුරට ජනතා විශ්වාසය රැකගත් එකක් බවට පත්ව ඇත්දැයි සළකා බැලිය යුතුය. එහිලා අපගේ අවධානය නිරායාසයෙන් යොමු කළ යුතු ක්ෂේත්‍ර කිහිපයක් ඇත. එනම්

1. ආබාධ සහිත පුද්ගලයන් ද ඇතුළත්ව අන්තර්කරණය යුත් සියලු සුදුසුකම්ලත් තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට දායක කර ගැනීම.

2. විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකීකයන් හට ඡන්ද භාවිතයට අදාළ පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

3. මැතිවරණ සඳහා ඉදිරිපත් වන සියලු අපේක්ෂකයන් හට තරඟ කිරීමට පහසු ආකාරයට යම් යම් මූල්‍යමය සීමා පනවා සම තරඟ බිමක් නිර්මාණය කිරීම.

එවන් පසුබිමක් මෙරටේ මේ වන විට නිර්මාණය වී තිබේදැයි අප විමසිය යුතු අතර එසේ නොවන්නේ නම් සුපිළිපන්න මැතිවරණයක් සඳහා අවැසි පසුබිම වහා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුව ඇත.

ඉහත දැක්වූ තෙවැනි කරුණ, එනම් මැතිවරණ වියදම් පාලනය කිරීමේ යාන්ත්‍රණයක් පිළිබඳව මේ වන විටත් මෙරටේ යම් කථා බහක් නිර්මාණය වී ඇත. ඕනෑම අපේක්ෂකයකුට, තමන් අභිමත ඕනෑම වියදමක්, කවර හෝ ක්‍රමවේදයක් ඔස්සේ වැය කිරීමට හැකියාව ඇති ලොව නිදහස් රටවල් අතරින් එකක් වන්නේ ශ්‍රී ලංකාවයි. එතුළින් සිදු වී ඇති ආසන්නතම හානිය නම් කවර සුදුසුකම් හා අත්දැකීම් පැවතිය ද අරමුදල් සම්පාදනයේ දුර්වල අපේක්ෂකයා හට පසුබසින්නට සිදුවීමයි. එය පාලනයට නීති නැති රටක පවත්වන මැතිවරණ, සුපිළිපන්න යැයි කීම එතරම් පහසු නැත.